# කොළඹ විශ්වවිද්‍යාලය

## ශාස්ත්‍ර පීඨය

## ශාස්ත්‍රවේදී විශේෂ උපාධි සතරවන වසර පරීක්ෂණය

## දෙවන සෙමෙස්තරය - 2018/2019

## BST 4285 – ලෝක ආගම් පිළිබඳ අධ්‍යයනය

(පැ දෙකයි)

එක් කොටසකින් එක් ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න **තුනකට (03) පමණක්** පිළිතුරු සපයන්න.

---

I කොටස

1. තුලනාත්මක ආගම් අධ්‍යයනයේ අවශ්‍යතාව, එහි වැදගත්කම වර්තමාන ලෝකය විෂයයෙහි අවධානය යොමු කරමින් පැහැදිලි කරන්න.

2. තෝරාගත් ලෝක ආගම් තුනක් ඇසුරින් අනුගාමිකයන්ගේ ප්‍රමාණය, භූගෝලීය ව්‍යාප්තිය, පූජනීය ග්‍රන්ථ හා ඇදහිලි පිළිබඳ මූලික විවරණයක් කරන්න.

II කොටස

3. “ජුදා පසුබිම සහ සම්භවය තුළ නාසරතෙහි ජේසුස් දෙසූ දහමෙහි මූලික පදනම දේවරාජ්‍යයක් පිළිබඳවය”. ඉහත ප්‍රකාශය පසුබිම් කර ඔහුගේ ජීවිත සාක්ෂිය, දේශනා, මරණය, සහ පුනරුත්ථානය පිළිබඳ කිතුනු ඉගැන්වීම් සාකච්ඡා කරන්න.

4. කිතුනු සත්විධ සක්‍රමේන්තු හෙවත් ‘මාර්ගඵල’ නම් කොට ඒවා කිතුනුවන් තම ආධ්‍යාත්මික දිවිය හා සබැඳිව ගැලවීම සඳහා උපකාර වන ආගමික ප්‍රතිපදාවක් සේ අදහන ආකාරය විවරණය කරන්න.

## III කොටස

5. ඉස්ලාම් ආගමේ ප්‍රතිපත්ති අනුව මුස්ලිම්වරයෙකුගේ ජීවිතය අගයන්න.

6. පහත සඳහන් මාතෘකා අතුරින් දෙකකට කෙටි සටහන් සපයන්න.

   I. කාන්තා නිදහස
   II. අල්කුර් ආනය
   III. මස්ජිදය (පල්ලිය)
   IV. නීති ක්ෂේත්‍රය

******************************